# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි : 02/2022

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2022.06.22

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**මූල්‍ය රෙගුලාසිවල විධිවිධාන යටතේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2022 පෙබරවාරි 24 වැනි දින පැවති සිය 1073 වන සභාවාරයේ දී, විගණන කමිටුවේ නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව, බැඳුම්කර අයකර ගැනීමේ සමාලෝචන කමිටුවේ නිර්දේශය සහ පාලක සභාවේ අනුමැතිය ඇතිව සේවයේ යෙදී සිටියදී ප්‍රදාන ලැබූ සහ තවමත් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කර නොමැති සේවකයින්ගේ වැටුප්වලින් බැඳුම්කර ශේෂය අයකර ගැනීම සඳහා මූල්‍ය රෙගුලාසි 119 යොදා ගැනීමට අනුමැතිය ලබා දෙන ලදී.

සේවයේ යෙදී සිටින පහත සඳහන් සේවක කාණ්ඩවලින් මූල්‍ය රෙගුලාසි (F.R) 119 යටතේ බැඳුම්කර ශේෂ අය කරනු ලැබේ;

i. අනුමත කාලය දීර්ඝ කිරීම ඇතුළුව නියමිත කාල සීමාව තුළ පශ්චාත් උපාධි අධ්‍යයන සම්පූර්ණ කිරීමට අපොහොසත් වන තැනැත්තන්
ii. අවශ්‍ය පරිදි පශ්චාත් උපාධි අධ්‍යයන පිළිබඳ ප්‍රගති වාර්තා යැවීමට අපොහොසත් වන හෝ සති 3 ක් ඇතුළත ලිපි, විද්‍යුත් ලිපි හෝ යවන ලද වෙනත් ලිපි වලට ප්‍රතිචාර නොදක්වන තැනැත්තන්
iii. පියවීම් නියමයන්ට අනුකූලව කටයුතු නොකළ තැනැත්තන් (බැඳුම්කරය සම්පූර්ණයෙන් පියවීමට නියමිත දින සිට සති තුනක උපරිමයක් තුළ)
iv. ගෙවීම් සැලැස්මකට එකඟ වූ සහ එකඟ වූ පරිදි ගෙවීම් සැලැස්මට අනුව කටයුතු නොකරන තැනැත්තන් (වාරික දින සිට උපරිම සති තුනක්)

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ. කළේ :- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති

පිටපත්
1. ලේකම්/ අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. විගණකාධිපති
13. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්

ලිපි ගොනු අංක: යූජීසී/ සීඅයිඒ/එෆ්/අයිඒ චක්‍ර./1